සියලුම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# Provincial Department of Education - NWP

43 S I

## පළමු වාර පරීක්ෂණය - 10 ශ්‍රේණිය - 2019
## First Term Test - Grade 10 - 2019

නම/විභාග අංකය : ............................................... චිත්‍ර කලාව - I කාලය : පැය 01යි.

සැලකිය යුතුයි.

සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු මෙම පත්‍රයේ ම සපයන්න.

I පහත සඳහන් පින්තූරය ඇසුරු කරගෙන අංක 01 සිට 05 දක්වා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.



1. මෙම රූපයෙන් දැක්වෙන්නේ ............................................................................................ විහාරයයි.
2. මෙය ...................................................................... යුගයේ විසූ හතරවන බුවනෙකබාහු රජ සමයේ ඉදිකරන ලද්දකි.
3. මෙය ගඩොල් හා හුණු බදාමයෙන් ...................................................................... නම් වූ ගල්තලාවක් මත ඉදිකර ඇත.
4. මෙය ඉන්දීය ශිල්පියෙකු වන ............................................................................................ විසින් නිර්මාණය කර ඇත.
5. මෙම විහාරයේ වියන්තලයේ නිර්මාණය කර ඇති ලියවැල් මෝස්තරයට අමතරව දක්නට ඇති ............................... ............................................................................................ අගනා නිර්මාණයකි.

I අංක 06 සිට 10 තෙක් දී ඇති ප්‍රශ්නවලට කෙටි පිළිතුරු සපයන්න.

6. ශ්‍රී ලංකාවේ පාරම්පරික කලාවක නිර්මාණකරුවා වන ඊ වඩුවා සම්බන්ධව ජන කලාව කුමක් ද?.......................................
7. කාන්තා රූප හතක් යොදා ගනිමින් දෝලාවක හැඩයට නිර්මාණය කර ඇති පාරම්පරික සැරසිලි මෝස්තරය හඳුන්වන නම කුමක්ද?...............................................
8. වෙස් මුහුණු වර්ග හැඩගැන්වීමට ප්‍රථම කිරිමැටි හෝ මකුළුමැටි යොදාගනිමින් තවරන සුදු පැහැති ආලේපය කුමන නමකින් හැඳින්වේද? ............................................................................................
9. චිත්‍රයක් ඇඳීමේ දී ළඟ වස්තූන් විශාලවත් දුරවස්තූන් කුඩාවටත් ඇඳීම හඳුන්වන නම කුමක් ද?................................ ............................................................................................
10. දකුණු ඉන්දීය විජය නගර් ගෘහ නිර්මාණ ශිල්පයට අනුව ඉදිකරන ලද ගම්පල යුගයට අයත් විහාරස්ථානය කුමක් ද?............................................................................................

I  **ප්‍රශ්න අංක 11 සිට 15 දක්වා A B C D E යන රූප සටහන් ඇසුරෙන් පිළිතුරු සපයන්න.**



A



B



C



D



E

11. A අක්ෂරයෙන් දැක්වෙන බුදු පිළිමය නිර්මාණය කර ඇති යුගය කුමක් ද?....................................................................

12. B අක්ෂරයෙන් දැක්වෙන රූපය හැඳින්වෙන නම කුමක් ද? ....................................................................

13. C අක්ෂරයෙන් දැක්වෙන ස්තූපයේ ගර්භයේ හැඩය කුමක් ද? ....................................................................

14. D අක්ෂරයෙන් නිරූපණය වන කලා නිර්මාණය සෑදීම සඳහා ගන්නා ද්‍රව වර්ගයක් නම් කරන්න.......................................
.......................................................................................

15. පූජනීය ස්ථානවල E අක්ෂරයෙන් දැක්වෙන රූප දෙකක් අතර තොරණ මධ්‍යයේ දක්නට ලැබෙන රූපය නම් කරන්න.
.......................................................................................................................

I  **අංක 16 - 20 දක්වා දී ඇති ප්‍රශ්නවලටවඩාත් ගැළපෙන පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.**

16. යම් වස්තුවක් ඇඳීමේදී එයට එළිය අඳුර එක් කිරීම තුළින් බලාපොරොත්තු වන්නේ,
    (1) වස්තුවේ විශාලත්වය පෙන්වීම  (2) වස්තුවේ ඝනත්වය පෙන්වීම
    (3) වස්තුවේ ද්විමාන බව දැක්වීමයි  (4) වස්තුවේ වර්ණවත් බව දැක්වීමයි

17. අඳුරුතුළින් ආලෝකය වඩාත් තීව්‍ර ලෙස මතුකර දක්වමින් වර්ණ කිරීම හඳුන්වන්නේ,
    (1) වර්ණාවලිය  (2) ක්ෂයවෘද්ධි ක්‍රමය  (3) කියරෝස්කුරෝ  (4) එළිය අඳුර

18. නව කැලණි විහාරයේ චිත්‍රවල දැකිය හැකි පොදු ලක්ෂණයක් වන්නේ,
    (1) ප්‍රාණපූර්ණ සියුම් රේඛා කරණය  (2) මහනුවර යුගයේ සිතුවම් ශෛලිය
    (3) රතු පසුබිම හා කළු බාහිර රේඛා කරණය  (4) බටහිර ස්වභාවිකවාදී ශෛලිය

19. අනුරාධපුර යුගයට අයත් විශිෂ්ඨතම කලා කෘතියක්වන වාහල්කඩ දක්නට ලැබෙන ස්ථානය වන්නේ,
    (1) රුවන්වැලි සෑයයි  (2) කණ්ඨක චෛත්‍යයි  (3) මිරිසවැටිය දාගැබයි  (4) අභයගිරිය දාගැබයි

20. භූමි ස්පර්ශ මුද්‍රාව නිරූපිත බුදු පිළිම වලින් නිරූපිත අවස්ථාව වනුයේ,
    (1) ධ්‍යානයකට සමවැදී සිටින ආකාරයයි.
    (2) බුදු වූ අවස්ථාව නිරූපණය කිරීමයි.
    (3) ගැටළුවක් විසඳෙන අවස්ථාව සංකේතවත් කරයි.
    (4) ධර්මය දේශනා කරන අවස්ථාව නිරූපණය කරයි.

I අංක 21 සිට 25 දක්වා දී ඇති රූපවලට ගැළපෙන පිළිතුර තෝරා අක්ෂරය යොදන්න.

21. 

F

දළදා මාලිගාවේ දක්නට ලැබෙන සැරසිල්ලකි. (..............................)

22. 

G

ආගමික උත්සව අවස්ථාවකදී යොදා ගන්නා සැරසිල්ලකි. (..............................)

23. 

H

ලෝකඩ මාධ්‍යයෙන් කරන ලද නිර්මාණයකි. (..............................)

24. 

I

ගම්පොළ යුගයට අයත් නිර්මාණයකි. (..............................)

25. 

J

කළුගලින් කළ නිර්මාණයකි. (..............................)

I ප්‍රශ්න අංක 26 සිට 30 දක්වා දී ඇති ප්‍රශ්නවලට අදාළවන හිස්තැනට සුදුසු පිළිතුර ලියන්න.

26. නාට්‍යයට අදාළ චරිතවල භූමිකාව සාර්ථකව ප්‍රකාශ වීම සඳහාත් නාට්‍යයේ අලංකාරය උදෙසාත් යොදන ඇඳුම් පැළඳුම් .................................................................................................... ලෙස හඳුන්වයි.

27. ශ්‍රී ලංකා රජයේ ජාතික කොඩිය හා සෙංකෝලය නිර්මාණය සඳහා .................................................................. ශිල්පියාගේ දායකත්වය පැසසිය යුතුය.

28. අනුරාධපුර යුගයේ මුරගල් අතරින් කලාත්මක අතින් උසස්ම නිර්මාණය .................................................................. ඉදිරිපිට දක්නට ඇත.

29. මන්දගාමී සහ අධිවේගී චලන භාවිතා කර ළමා මනසට උචිත ලෙස රූපවාහිනියෙන් ඉදිරිපත් කරන නිර්මාණ ............................................................................................ ලෙස හැඳින්වේ.

30. හින්දු කෝවිලක කැටයම් මූර්ති සහිත ප්‍රධානතම ගෘහ නිර්මාණ අංගය ............................................................ ලෙස හැඳින්වේ.

I **ප්‍රශ්න අංක 31 සිට 35 දක්වා දී ඇති වචනවල අර්ථය පැහැදිලි වනසේ වාක්‍යය බැගින් ලියන්න.**

31. ප්‍රේස්කෝ සීකෝ ..............................................................................................
..............................................................................................

32. ද්විතියික වර්ණ ..............................................................................................
..............................................................................................

33. අල්ප උන්නත ..............................................................................................
..............................................................................................

34. ඝන කැපීම ..............................................................................................
..............................................................................................

35. ත්‍රිභංග ..............................................................................................
..............................................................................................

I **ප්‍රශ්න අංක 36 සිට 40 දක්වා දී ඇති උපශීර්ෂවලට අදාළව ඡායාරූපය හඳුනාගෙන එහි කලා ලක්ෂණ ඇතුළත් වන සේ ඇගයීමක් කරන්න.**



36. හඳුනාගත් බව (තේමාව) ..............................................................................................

37. ශිල්පියා ..............................................................................................

38. ශෛලිය..............................................................................................

39. යුගය ..............................................................................................

40. ශිල්පීය කුසලතා ..............................................................................................

සියලුම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
Provincial Department of Education - NWP

43 | S | II

# පළමු වාර පරීක්ෂණය - 10 ශ්‍රේණිය - 2019
# First Term Test - Grade 10 - 2019

නම/විභාග අංකය : ................................................ චිත්‍ර කලාව - II කාලය : පැය 02යි.

සැලකිය යුතුයි.

- ඔබේ විභාග අංකය උත්තර පත්‍රයේ පසු පිටේ පැහැදිලි ව සටහන් කරන්න.
- උත්තර පත්‍රය විභාග ශාලාධිපතිට භාර දෙන විට වියළී තිබිය යුතු ය. තෙත් චිත්‍ර එකට ඇලී තිබීම ඔබට අවාසිදායක විය හැකි ය.
- දිය සායම්, පෝස්ටර් සායම්, ටෙම්පරා සායම්, පැස්ටල් හෝ අතේ නොගෑවෙන ඕනෑ ම වර්ණ මාධ්‍යයක් භාවිත කළ හැකි ය. (ෆෙල්ට් පෑන් භාවිතය සුදුසු නැත.)
- සියලුම ද්‍රව්‍ය ඇස්මට්ටමින් පහළ සිටින සේ තැබීමට ශාලාධිපතිවරුන්ට උපදෙස් දී ඇත.

---

- නිදහස් රේඛාමය ඇඳීම හා වර්ණ සම්පිණ්ඩනය
- ඔබ ඉදිරියේ තබා ඇති ද්‍රව්‍ය සමූහය හොඳින් නිරීක්ෂණය කොට, චිත්‍රය නිර්මාණය කරන්න.
    1. රේඛා මගින් පූර්ව අධ්‍යයනයක යෙදෙන්න. මේ සඳහා වෙනත් කඩදාසියක් භාවිත කරන්න.
    2. ද්‍රව්‍ය සමූහය පෙනෙන අයුරින් ඇඳ වර්ණ කරන්න.
- මෙම චිත්‍ර දෙක ම එකට අමුණා විභාග ශාලාධිපතිට භාර දෙන්න.
- ඔබේ චිත්‍රය ඇගයීමේ දී පහත කරුණු කෙරෙහි සැලකිලිමත් වන බව සලකන්න.

- රේඛා අධ්‍යයනය
    1. මුල් කඩදාසියේ කරනු ලබන පූර්ව අධ්‍යයනයේ දී දක්වන කුසලතා
- වර්ණ චිත්‍රය
    2. ද්‍රව්‍ය සමූහය, තලය මත කලාත්මක ව සම්පිණ්ඩනය වීම.
    3. පරිමාණ, පර්යාලෝක රීති හා ත්‍රිමාණ ලක්ෂණ පිළිබඳ අවබෝධය
    4. දෙන ලද ද්‍රව්‍ය සමූහයේ මතුපිට ස්වභාවය හා ගතිලක්ෂණ දැක්වීම
    5. වර්ණ හැසිරවීමේ ශිල්පීය කුසලතා
    6. උචිත පසුබිමක් යෙදීම හා සමස්ත නිමාව

සියලුම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව Provincial Department of Education

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# Provincial Department of Education - NWP

| 43 | S | III |
|---|---|---|

## පළමු වාර පරීක්ෂණය - 10 ශ්‍රේණිය - 2019
## First Term Test - Grade 10 - 2019

නම/විභාග අංකය : .............................................. චිත්‍ර කලාව - III කාලය : පැය 02යි.

- ඔබේ විභාග අංකය හා අදාළ ප්‍රශ්න අංකය උත්තර පත්‍රයේ පසු පිටේ පැහැදිලි ව සටහන් කරන්න.
- 'අ' කොටසින් හෝ 'ආ' කොටසින් හෝ 'ඉ' කොටසින් හෝ එක් මාතෘකාවක් පමණක් තෝරා වර්ණවත් චිත්‍රයක් නිර්මාණය කරන්න.

### 'අ' කොටස ප්‍රකාශය

01. ඇළක දොළක කෙළි දෙලෙන් දියනාන ළමයි පිරිසක්
02. සිංහල/දෙමළ අලුත් අවුරුද්දේ ඔබ සිත්ගත් අවස්ථාවක්
03. පූජනීය ස්ථානයක ආගමික වතාවත්වල නියැලෙන බැතිමතුන් පිරිසක්
04. නිදහසේ සැරිසරන වන සතුන්

### 'ආ' කොටස මෝස්තර

05. අටපෙති මලක් සහ කොළයක් යොදාගනිමින් ගවුම් රෙද්දකට සුදුසු ව්‍යාප්ත මෝස්තරයක් නිර්මාණය කරන්න. (මෙය අගල් 8 5 8 කොටුවක් තුළ සැලසුම් කරන්න.)
06. සත්ත්ව රූපයක් යොදා ගනිමින් සරොම් වාටියකට සුදුසු මෝස්තරයක් නිර්මාණය කරන්න.
07. සාම්ප්‍රදායික මෝස්තර උපයෝගී කරගෙන පිත්තල බන්දේසියකට සුදුසු නිර්මාණයක් කරන්න.

### 'ඉ' කොටස ග්‍රැෆික්

08. මත්ද්‍රව්‍ය නිවාරණය යන තේමාවට උචිත පෝස්ටරයක් නිර්මාණය කරන්න.
09. පාසල් ක්‍රීඩා උළෙලහි සමරු කලාපය සඳහා සුදුසු මුල් කවරයක් සැලසුම් කරන්න.
10. පහළොස්වන (15) උපන් දිනය සමරන ඔබේ මිතුරාට හෝ මිතුරියට හෝ ගැළපෙන සුබ පැතුම් පතක් නිර්මාණය කරන්න.

Answer

සියලුම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව Provincial Department of Education

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# Provincial Department of Education - NWP

43 | S | I - II

## පළමු වාර පරීක්ෂණය - 10 ශ්‍රේණිය - 2019
## First Term Test - Grade 10 - 2019

### චිත්‍ර කලාව - පිළිතුරු පත්‍රය

I කොටස

1. ලංකා තිලක විහාරය
2. ගම්පොළ
3. පැන්හල්ගල
4. ස්ථපතිරායර්
5. සිවු හංස පූට්ටුව
6. ලාක්ෂා
7. සප්තනාරි පැල්ලක්කිය
8. අල්ලියාදු ගැම
9. පර්යාවලෝකනය
10. ගඩලාදෙණිය
11. මහනුවර යුගය
12. නවනාරිකුඤ්ජරය
13. බුබ්බුලාකාර
14. වෙල් කඳුරු
15. කිහිඹි මුහුණ
16. (2)
17. (3)
18. (1)
19. (2)
20. (2)
21. H
22. I
23. F
24. G
25. J
26. රංග වස්ත්‍රාභරණ
27. එස්. ආර්. චාර්ල්ස්
28. රත්නප්‍රාසාදය
29. කාටුන්
30. ගෝපුර
31. වියළි බදාමය මත චිත්‍ර ඇඳීම/බදාමය වියළුන පසු චිත්‍ර ඇඳීම
32. මූලික වර්ණ දෙකක් එකට එකතු කිරීමෙන් සෑදෙන වර්ණ කාණ්ඩය
33. කැටයමක ස්වල්පයකින් මතු කිරීම උදා:- පිත්තල බන්දේසි කැටයම් (1/4 කැටයම මතු කිරීම)
34. වෙස් මුහුණු සෑදීමෙන් ලී කඳන් කපා පොතු ගසා කැබලිවලට කපා ගැනීම
35. චිත්‍රයක හෝ මිනිස් මූර්තියක උරහිස/ඉණ/දණහිස ස්ථානයන් තුන් තැනකින් නැවී තිබීම
    උදා:-නා රජ මුරගල, (කරුණු දක්වා ඇති ආකාරයට ලකුණු ලබා දෙන්න.)
36. මහා ප්‍රජාපතීගෝතමී හා සිද්ධාර්ථ කුමරු (මව හා දරුවා)
37. M. සාර්ලිස් ශිල්පියා
38. අපරදිග/බටහිර ස්වභාවිකවාදී චිත්‍ර ශෛලිය
39. නූතන යුගය
40. ත්‍රිමාණ බව, පර්යාවලෝකනය හා වර්ණභාවිතය, තලය හැසිරවීම, රේඛාව හා හැඩතල භාවිතයේ ප්‍රකාශ කර ඇති ආකාරය විශිෂ්ටය.
    (එක් ප්‍රශ්නයකට 1 ලකුණ බැගින් 1 5 40 = 40

II කොටස ස්වභාවිකත්ව අධ්‍යයනය හා ද්‍රව්‍ය සම්පිණ්ඩනය ලකුණු දීමේ නිර්නායක

| | | |
|---|---|---|
| 01. | රේඛා අධ්‍යයනය | ලකුණු 05 |
| 02. | ද්‍රව්‍ය සමූහය තලය මත අර්ථවත්ව සංරචනය කිරීමේ හැකියාව | ලකුණු 05 |
| 03. | ද්‍රව්‍යයන්ගේ පරිමාණ හා ස්වභාවය ප්‍රකාශ කිරීමේ හැකියාව | ලකුණු 05 |
| 04. | සිද්ධාන්ත භාවිතය පිළිබඳ අවබෝධය (පර්යාවලොකය ත්‍රිමාණ ලක්ෂණ ඇස් මට්ටම අවකාශ භාවිතය) | ලකුණු 05 |
| 05. | වර්ණ භාවිතය හා ගති ලක්ෂණ දැක්වීම | ලකුණු 05 |
| 06. | චිත්‍රයේ පසුතලය ඇතුළු සමස්ත නිමාව | ලකුණු 05 |
| | ප්‍රශ්න පත්‍රයට හිමි මුළු ලකුණු | ලකුණු 30 |

II වන පත්‍රය සඳහා හිමි ලකුණු ලකුණු 30

## III පත්‍රය ''අ'' කොටස චිත්‍ර සංරචනය

ලකුණු දීමේ නිර්නායක

| | |
|---|---|
| (1) තෝරාගත් මාතෘකාව ප්‍රකාශ කිරීමේ දී ඊට උචිත වාතාවරණය හා ප්‍රකාශ කර ඇති අයුරු | ලකුණු 06 |
| (2) මානව රූප හා සත්ත්ව රූ ඇතුළු සියලු හැඩතල තල මත සමපිණ්ඩනය කර ඇති අයුරු | ලකුණු 06 |
| (3) සිද්ධාන්ත භාවිතය | ලකුණු 06 |
| (4) වර්ණ භාවිතයේ කුසලතා | ලකුණු 06 |
| (5) අනුමත ශෛලියට අනුව චිත්‍රයේ සමස්ත නිමාව | ලකුණු 06 |
| මුළු ලකුණු | ලකුණු 30 |

## III පත්‍රය ''ආ'' කොටස මෝස්තර හා සැරසිලි නිර්මාණය

ලකුණු දීමේ නිර්නායක

| | |
|---|---|
| (1) මාතෘකාවට හා කාර්යයට උචිත අයුරින් නව්‍යතාවකින් යුතුව සැලසුම් කිරීම | ලකුණු 06 |
| (2) පාරිභාරික අවශ්‍යතාවන්ට ගැළපෙන බව | ලකුණු 06 |
| (3) නිර්මාණාත්මක බව හා හැඩතල සම්පිණ්ඩනය කිරීමේ හැකියාව | ලකුණු 06 |
| (4) උචිත වර්ණ තෝරාගෙන භාවිත කිරීමේ හැකියාව | ලකුණු 06 |
| (5) විචිත්‍රත්වය, චමත්කාර ජනක බව, සමස්ත නිමාව | ලකුණු 06 |
| මුළු ලකුණු | ලකුණු 30 |

## III පත්‍රය ''ඉ'' කොටස ග්‍රැෆික් චිත්‍ර

| | |
|---|---|
| (1) මාතෘකාවට අදාළ නිර්මාණ කාර්යයට උචිත අයුරින් සැලසුම් කිරීම | ලකුණු 06 |
| (2) වාණිජමය හා කර්මාන්තයට උචිත අයුරින් සැලසුම් කිරීම | ලකුණු 06 |
| (3) රේඛා හා හැඩතල හා සැරසිලි අර්ථවත්ව භාවිත කිරීමේ හැකියාව | ලකුණු 06 |
| (4) උචිත වර්ණ තෝරාගෙන භාවිත කිරීම | ලකුණු 06 |
| (5) විචිත්‍රත්වය, චමත්කාරය හා සමස්ත නිමාව | ලකුණු 06 |
| මුළු ලකුණු | ලකුණු 30 |

| | | |
|---|---|---|
| (i) | - පත්‍රය සඳහා ලකුණු | 40 |
| (ii) | - පත්‍රය සඳහා ලකුණු | 30 |
| (iii) | - පත්‍රය සඳහා ලකුණු | 30 |
| | මුළු ලකුණු | 100 |